


don.wickrama@yahoo.com.au

මෙවර සන්නස මාසිකය තුලින් ඔබ සමඟ සාකච්ඡාවට එකතුවන්නේ සුවිශේෂ වූ පුද්ගලයෙක්. පුද්ගලයකුගේ ජීවිත කාලයෙන් කැපවෙන අධ්‍යාපනය, පවුලේ වගකීම්, රැකියාව, පරිසරය හා සමාජය සත්කාරය පොත පත සාහිත්‍ය කලාව පිළිබඳ කැපවීම් කටයුතු වන මේ සා විශාල මෙහෙවරක යෙදෙන්නට තම ජීවිත කාලයක් කැප කරන්නකු වේ නම් ආචාර්ය උභයසිරි විජයනන්ද වික්‍රම මහතාටත් මුල් ස්ථානයක් හිමිවෙනවා.

ඔහුගේ මූලික අධ්‍යාපනය වන්නේ පියා ඉගැන්වූ ගමේ ඉස්කෝලයයි. අගලවත්ත මැතිවරණ කොට්ටාශයේ දියකඩුව මිශ්‍ර පාසැලින් ඉගෙන ගෙන වැඩිදුර අධ්‍යාපනය සඳහා කොළඹ කේරි විදුහලට ඇතුලත් වෙනවා. කැළණිය විද්‍යාලංකාර විශ්ව විද්‍යාල සරසවි පිවිසුමක් සමඟ 1959 දී ආරම්භක ශිෂ්‍යයන්ගෙන් අයකුවීමද වැදගත් මතක සටහනක්.

ආචාර්ය සුනන්ද මහේන්ද්‍ර, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී ශ්‍රී ලංකා කලා මණ්ඩල සභාපති ජයසුමන දිසානායක මහත්මා දැනට කැළණිය විශ්ව විද්‍යාලයේ කුලපති මහාචාර්ය වැලමිටියාවේ කුසලධම්ම නායක හිමි ද සම කාලීනයන් ලෙස ඔහු හා සිටි අය.

එම විශ්ව විද්‍යාලයේ සිංහල සමිතියේ වාර්ෂික සඟරාව වන "සිංහල සඟරාවත් " ඉංග්‍රීසි අංශයේ FOCUS නම් වූ සඟරාවන් 61-62 යන වර්ෂවල ඔහු විසින් ආරම්භ කලා.



Nawala,
Rajagiriya,4.2.1961.

Dear Mr.Wickrama,

Thank you for your letter. Though I am busy in correcting and revising the proofs of my auto-biography I will try to send you an article as early as possible.

I believe, Russian literary men do not accept the distinction between the novel and the short story as made by European critics, The Russian word for the short story is 'rasskazi' which means 'story'. The other Russian word for the longer short story is 'povost' which means 'narrative.' 'Roman' is the Russian word for the novel. Therefore I propose to make my subject "The Russian Novel". Except Chekov all major Russian novelists wrote short stories ignoring the Western definition of the short story.

Yours sincerely,
Martin Wickramasinghe
Martin Wickramasinghe.

මාර්ටින් වික්‍රසිංහයන් මෙහි ඇතුලාන්තය පිලිබඳව කල විග්‍රහයක්ද තවත් වැදගත් වූ දෙයක්. සිංහල හා ඉංග්‍රිසි පිළිබඳව ශාස්ත්‍රවේදි ගෞරව උපාධිය BA ලැබීමෙන් පසු 62 වර්ෂයේ සිට 70 වර්ෂය දක්වා කොළඹ කේරි විද්‍යාලයේ අචාර්යවරයෙකු ලෙස සේවය කලා.

පසුව පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පශ්චාත් උපධියද ලබා 1970 වසරේ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ඉංග්‍රිසි පිළිබඳ කතිකාචාර්යවරයා ලෙස සේවය කලා. මෙය රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද පත්වීමක්. 1971-74 කාලය තුල අධිනීතිඥ පාඨමාලාවක් ද හදරා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිඥවරයෙකු ලෙස 76 වසරේදි දිවිරුම් දුන්නා. 72 වසරේ නීතිඥවේදී නම් වූ සඟරාව ද වික්‍රම අතින් බිහිවුණු තවත් සඟරාවක්.

මහරගම ගුරු අභ්‍යාස ආයතනයේ ඉංග්‍රිසි ගුරුවරියකු වූ උදය හඳු, සමග විවාහයත් සමඟ කසුන් ඉන්දජිත් පුතනුවන් හා තිසරණී හරීන්ද දියණිය පවුලට එකතුවූ ආදරනීය සාමාජිකයන් වුනා. 1986 දී ඕස්ටේලියානු සංක්‍රමණය සිදුවීම වැදගත් සිද්දියක් වුනා වගේම 1981 පොදු රාජ්‍ය මණ්ඩල ශිෂ්‍යත්වයක් ලෙස එංගලන්තයේ බර්මින්හැම් විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති ශිෂ්‍යත්වයක්ද ලබාගත්තා.
ඕස්ට්‍රේලියාවට සංක්‍රමණයෙන් පසුව TAFE කොලීජියේ ඉංග්‍රීසි පිළිබඳ ආචාර්යවර්යකු ලෙස රැකියාව කරන්නට වුනා. 1986-2011 දක්වාම Adult Migrant English Service හි ජ්‍යෙෂ්ඨ ආචර්යවරයා ලෙස කටයුතු කරන්නට අවස්ථාව උදාවුනා. 1990දී ඕස්ට්‍රේලියාවේ ස්ථාපිත සිංහල සංස්කෘතික හමුව ආරම්භ කිරීමට මූලික වූ වික්‍රම ලාංකේය සංස්කෘතියේ අගය විදහා දක්වන්නට, ඒ පිළිබඳ සිංහල පිරිස් නැඹුරු කරන්නට ද සමත්වුනා.

ආරම්භක සමලේකම් වූ ඔහු ව්‍යවස්ථා කෙටුම්පත් සම්පාදක හා සිංහල ඉගැන්වීමේ වැඩසටහන ආරම්භ කිරීමේ නිර්මාතෘද වුනා. එවකට රක්ෂණය නොමැති සංවිධානයක් ලෙස තිබූ පිරිසකගේ සංවිධානයක් තම පෞද්ගලික වගකීම දරා සිංහල පාසැලක් පවත්වා ගෙන යාමේ වගකීමේ දැරුවා.
සිංහල සංස්කෘතික හමුවෙන් නිකුත්වන **සිංහල** නම් වූ සඟරාවද වික්‍රමගේ මූලිකත්වය ගත් තවත් කර්තව්‍යයක්. 1992 දී සිඩ්නි ශ්‍රී ලංකා බෞද්ධ විහාරය (**ලංකාරාමය**) ආරම්භයේ දී ව්‍යවස්ථා සම්පාදනයෙන් හා ඇරඹුම් සංවිධායකයෙකු ලෙස ඉතිහාසයට ඔහුගේ නමත් සටහන් වෙනවා.
1992 දී ඕස්ට්‍රේලියානු විශේෂ ගුවන්විදුලි සේවයක් වන SBS ප්‍රතිව්‍යුහ ගතකිරීමේදී සිංහල අංශයක් බිහිකිරීමේ භාරදූර වගකීමත් වගේම ප්‍රථම අංශභාර නිලධාරියා හා විධායක නිෂ්පාදකවරයා ලෙස වික්‍රම මහතා පත්කර ගත්තා.
1998 SCATS සංවිධානයක් පිහිටුවීමේදී ද ව්‍යවස්ථා සම්පාදක ආරම්භකයින් ලෙස ද කටයුතු කලා.


ආචාර්ය උබයසිරි විජයනන්ද වික්‍රම මහතාට නිව් සවුත් වේල්සයේ අග්‍රාණ්ඩුකාරවරිය වූ MARIE BASHIR මහත්මිය අතින් OAM මෙඩලය පළඳවන අයුරු


**SBS ගුවන් විදුලියේදී මහාචාර්ය සුනිල් ආරියරත්නයන් සමග පිළිසඳරක**

2008 වසරේ දී ඕස්ට්‍රේලියානු රජයෙන් පුද ලද ගරු බුහුමන් ඔහුගේ ජීවිත ගමනේ අමතක නොවනා මතකයක් හා වාසනාවක් ලෙසයි වික්‍රම හදුන්වන්නේ ඒ ප්‍රබුද්ධ ජන සම්මානයයි ඔහුට ලැබුන Order of Australia Medal සම්මානය. ගුවන් විදුලිය වගේම සාහිත්‍යමය පොත පතද ඔහු අතින් බිහිවූවා. අකල් මරණ,Language Policy Development in Colonial Ceylon නැමති පොත් පත්ද වුනා. 2007 දී ඕස්ට්‍රේලියානු New England විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය (PHD )උපාධියද ඔහුට පිරිනැමුවා. ගුවන් විදුලියට , පොත පතට, කලාවට ඇල්ම එදා සිටම අද දක්වාම වික්‍රම තුලින් නිසඟයෙන් එන කුසලතාවන්.

එදා 1964 දී ශ්‍රී ලංකා ලලිත කලායතනයේ මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර, විශාරද W D අමරදේව, නාට්‍යාචාර්ය එස් පනීභාරත, නාට්‍ය නිෂ්පාදක ගුණදාස ගලප්පත්ති, දයානන්ද ගුණවර්ධන හා එක්ව නාට්‍ය කලාව පිළිබදව වූ පාඨමාලාවන් ද හදරා සහතික පත්‍රයෙන් ද අගැයූ ඔහු ඒ පිලිබදව වූ පුහුණු ඥාණයද සමන්විත අයෙක්.

අද දවසේ නවතම නිර්මාණයක් ලෙස ඔහු විසින් එළිදක්වන **"දහසක් සිතිවිලි"** වික්‍රමගේ තවත් වික්‍රමාන්විතයක්. නිහඩව බොහෝ වැඩ කොටසකට උර දුන් ඔහු විරාමයක් ලද සැනෙක කුරුටු ගෑ ගී පැදි අද දවස සංගීත තැටියක සුභාවිත ගීතයක් සේ අලංකාර කරයි. දහසක් සිතුවිලි ඔහුගේ අතින් ලියවුනු නවතම ගී පොකුරයි. මෙහි ගීත 14ක් අඩංගුවේ.
ඉන් දෙකක් ඔහුගේ බිරිද **උදය හද්‍රා** විසින් රචනා කර තිබීම තවත් වු විශේෂයක්

සිඩ්නි නුවර පෙනන්ට් හිල් බිලූ එලිෆන්ට් ශාලාවේ 2016 දෙසැම්බර් මස 11 ඉරුදින එළි දක්වමින් **දහසක් සිතුවිලි** සැරසන්නේ ඕස්ට්‍රේලියානු ශ්‍රී ලාංකික ප්‍රජාවට කලාවට යමක් එකතුකරමින්... **සුනිල් එදිරිසිංහ,හර්ෂණ දිසානායක,සමන්ත පෙරේරා, සමන් ලෙනින්,සංගීත් නිපුන් මහාචාර්ය සනත් නන්දසිරි,ටී.එම් ජයරත්න, විශාරද එඩ්වඩ් ජයකොඩි, නෙලු අධිකාරි,ආචාර්ය දයාරත්න රණතුංග, දේශජ ගුණවර්ධන** දහසක් සිතුවිලි සංගත තැටියේ අලංකාරයට එකතුවේ. සංගීතය **ඉන්දජිත් මිරිහානගේ** ගෙනි.

දුරු රටක සිට මව් රටත් භාෂාවත් යා කරන්නට දරන තැතක සුන්දර වූ ගීයකින් අපේ කම රකින්නට අපේ හඩ නගන්නට එක්වෙන මොහොතක් ඒ වෙනුවෙන් අපේ හා සන්නස සුභාසිංශණය වික්‍රම මහතාට මෙසේ පුද කරමු.
**වේවා වේ සුබම සුබ කටයුත්තක් ආචාර්ය උබයසිරි විජයනන්ද වික්‍රම මහාතාණෙනි.**

kaldemulla@gmail.com